THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
GMOA
ESTABLISHED IN 1926
TU No. 291
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

23.12.2013

මාධ්‍ය නිවේදනය

## "රටපුරා සුරක්ෂිත ආහාර ප්‍රචලිත කිරීමේ ප්‍රයත්නය"

සුරක්ෂිත ආහාර රටාවක් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා වෙබ් අඩවියක් ස්ථාපනය කරන ලෙස මුදල් අමාත්‍යංශ ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතා, රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය වෙත ඉල්ලීමක් කරන ලදි.

මේ සම්බන්ධව තවත් පියවරක් ලෙස සුරක්ෂිත ආහාර මධ්‍යස්ථානයක්, කොළඹ 07, ශ්‍රී සම්බෝධි විහාරස්ථාන පරිශ්‍රයේදී ආරම්භ කරන ලෙස එහි විහාරාධිපති පූජ්‍ය දරණගම කුසලධම්ම නාහිමියන් අප වෙත ඉල්ලීමක් කරන ලදි.

මේ අනුව දෙසැම්බර් 29 වන ඉරිදා උදෑසන අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් අලුත් අවුරුද්දට සුරක්ෂිත ආහාර ලබා ගත හැකි මධ්‍යස්ථානයක් සුවසෙත මැදුර නමින් විවෘත කිරීමටත් www.healthysrilanka.lk නම් වෙබ් අඩවියක් විවෘත කිරීමටත් අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත.

මෙමඟින් අප බලාපොරොත්තු වන්නේ,

1. දේශිය ධාන්‍ය එලවලු හා පළතුරු සඳහා යොමු කිරීම
2. වස විසෙන් තොර ආහාර පරිභරනය ප්‍රවර්ධනය කිරීම.
3. රට තුළ ඉහළ යන බෝනොවන රෝග පාලනය කිරීමට හැකි යහපත් ආහාර රටාවක් ඇති කිරීම.
4. ජනතාවට නිවැරදි සෞඛ්‍ය තොරතුරු ලබා ගැනිමට අවස්ථා ලබා දිම වේ.

නමුත්, මෙම ආහාර මධ්‍යස්ථානය සඳහා රට පුරා වෛද්‍යවරුන් විසින් වස විසෙන් තොර පාරම්පරික සහල්, එලවලු සහ පළතුරු සෙවීමේදි පහත කරුණු අනාවරණය විය.

01 කිසිදු කෘෂි රසායන භාවිතයකින් තොරව පාරම්පරික දේශිය සහල් (වර්ග කිහිපයක් පමණක්) දිවයිනේ ප්‍රදේශ කිහිපයක සාර්ථකව වගාකර ඇති බව.

02 වෙළඳ පොලේ ඇති බොහෝ පළතුරු හා එලවලු කෘෂිරසායන අධික ලෙස යොදන ලද, සෞඛ්‍ය ආරක්ෂිත නොවන ඒවා බව.

03 එලවලු සහ පළතුරු වර්ග කෘෂි රසායන භාවිතයෙන් තොරව වගාකරන ස්ථාන ඇතත්, පාරම්පරික දේශිය එලවලු සහ පළතුරු බීජ දැනට ශ්‍රී ලංකාවේ සංරක්ෂණය කර නොමැති බව.

04 ශ්‍රී ලංකාවෙන් අස්ථාන ගත වී ඇති පාරම්පරික එලවලු සහ පළතුරු බීජ ජපානය සහ නෝර්වේ යන රටවල් සතුව ඇති බව.

මෙම ඉතාම බරපතල තත්ත්වය පිළිබඳව දෙසැම්බර් 29 වන දින අතිගරු ජනාධිපතිතුමා දැනුවත් කිරීමට ද රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය බලාපොරොත්තු වේ.

ස්තූතියි

For
වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර | වෛද්‍ය නලින්ද හේරත් | 0717876516 |
| | වෛද්‍ය ප්‍රියන්ත බණ්ඩාර | 0775345284 |
| | වෛද්‍ය නවීන් සොයිසා | 0718582444 |